**ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට අදාලව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 05/2023 දරණ උපදෙස් මාලාවේ 8.2 වගන්තිය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම්ගත කලයුතු වුවද, 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව නමට ලියාපදිංචි කරන ලද මිනි වෑන් රථයේ අගය හඳුනාගෙන නොතිබූ අතර ලියාපදිංචිය සඳහා වැයවූ රු.1,500,000 පමණක් සිගාස් වැඩසටහන තුල වාර්තා කර තිබුණි. | මිනි වෑන් රථයේ මිලදී ගැනීමේ වටිනාකම අප දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර ඉදිරියේදී එහි වටිනාකම තක්සේරු කර Cigas වැඩසටහනට වත්කම් ලෙස ඇතුලත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | වත්කම් පිරිවැය නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයන් 3 ක ඉතිරි ප්‍රතිපාදන භාවිතා කර 2023 දෙසැම්බර් 28 දින රු.548,435 ක් වැය කර කැමරාවක් හා උපාංග ද, රු.352,000 ක් වැය කර ලැප්ටොප් පරිගණකයක්ද මිලදී ගෙන තිබූ අතර, 2023 වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල මෙම ප්‍රසම්පාදනයන් ඇතුලත්ව නොතිබුණි. ප්‍රසම්පාදන අවශ්‍යතාව පිළිබඳ අනුමත සැලැස්මෙහි සංශෝධනයක්ද සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ අග භාගයේ සිට, 2015 හා 2016 වර්ෂයන්හිදි නිලධාරීන්ට ලබා දුන් ලැප්ටොප් පරිගණක අක්‍රීය තත්වයට පත්වීම හේතුවෙන් හෝ අලුත්වැඩියා කිරීමට ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙමින් පවතී.<br>ලැප්ටොප් පරිගණකය හා කැමරාව එයට අයත් උපාංග අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අයත් නොවූ අතර මෙම මිලදී ගැනීම අවශ්‍ය වූ බැවින් හා දෙපාර්තමේන්තු ගිනුම් පියවීමේ කටයුතු වල යෙදීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම යාවත් කාලීන කිරීමට නොහැකි වී ඇත.ඉදිරියේදී එවැනි අතපසුවීම් නොවීමට අදාල නිළධාරීන් හට අවවාද කරන ලද බව. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර එකී සැලැස්ම ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 01 ඡේදය පරිදි 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු වුවද 328-1-1-0-1404 වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉක්මවා රු.5,829,089 ක බැරකමක් සඳහා එළඹ තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිනුම් චක්‍රලේක 01 ඡේදය පරිදි ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැදීම් හා බැරකම් වලට නොඑළඹිය යුතු වුවද 328-1-1-0-1404 වැය විෂය වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය ගොඩනැගිලි කුලිය ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවීය. මෙය සිදු කළයුතුම වියදමක් බැවින් භාණ්ඩාගාරයෙන් ලබා දෙන සීමිත ප්‍රතිපාදන හමුවේ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹීමට සිදුවූ බව. | අනුමත සීමාවන් ඉක්මවා බැරකම්වලට නොඑලඹිය යුතුය. |

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඵලදායීව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලැබුවද එම පද්ධතියේ සඵලතාවය පිළිබඳ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇති අතර ඒ පිළිබඳව විගණකාධිපති හට පිටපතක් ඉදිපත් කර නොහැකි වූ අතර ඉදිරියේදී විගණකාධිපති හට පිටපතක් ඉදිරිපත් කර එය නිවැරදී කරන බව. | අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායීව පවත්වාගෙන යන බවට සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරික්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන තනතුර සඳහා පුරප්පාඩු ඇති බව රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දිගින් දිගටම දැනුම් දී ඇති අතර, ගණකාධිකාරී සේවයේ පුරප්පාඩු 500 කට ආසන්න ප්‍රමාණයක් ඇති බැවින් මෙම ඉල්ලීම පිලිබඳව ප්‍රමුඛතාවය ලැබී නොමැත. එබැවින් එම තනතුරේ වැඩබැලීමට හෝ රාජකාරි ආවරණය කිරිමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස පරිශ්‍රයේ ගණකාධිකාරි සේවයේ නිලධාරින් ගෙන් ඉල්ලීම්ද සිදුකර ඇති බව. | අභ්‍යන්තර විගණනය විධිමත් පරිදි සිදුකල යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මු.රෙ.104 (i) | | පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිව යුත්තන් නිෂ්චය කිරීම සඳහාත් පරීක්ෂණ ආරම්භ කල යුතු වුවත් දෙපාර්තමේන්තුවට අයත් වාහන දෙකක් සමාලෝචිත වර්ෂයේදී අනතුරුවලට ලක්වී ඇතත් අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මේ වන විට පරික්ෂණ කමිටුවක් පත් කරීමට කටයුතු කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | මු.රෙ.880 | | රජයේ මුදල්, ආදායම් හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය | මෙතෙක් මෙම දෙපාර්මේන්තුවේ නිලධාරින් ඇප තැබීමක් සිදු කර නොමැති බැවින්, ඒ පිළිබඳ තීරණය | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තැබිය යුතු වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ එවැනි ඇප තැබීමක් නිරීක්ෂණය නොවීය. | කිරීම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 07/2019 අනුව අමාත්‍යාංශ ලේකම්වරයෙකුට කළ හැකි බැවින් ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් වෙතින් විමසන ලෙස වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් ලිඛිත උපදෙස් ලබා දෙන ලදී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 1640/31 අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේ එක් අරමුණක් වන ජාතික මිනිස් බල ප්‍රතිපත්තිය සකස් කර ක්‍රියාත්මක කිරීම සිදුකල යුතු වුවද, එකී අරමුණු 2023 වර්ෂය වන විටත් ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි. 2015 වර්ෂයේදී සකස් කරන ලද ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කර වසර 05 කට අධික කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් එය නැවත සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තියක් නිරීක්ෂණය නොවීය. | මේ වන විට ජාතික මානව සම්පත් හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික මානව සම්පත් සංවර්ධන සභාව (NHRDC) කටයුතු කරමින් සිටින අතර ඊට අදාලව ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ සභාව වෙතින් විමසීම් කරන ලද ලිපිය ඉදිරිපත් කර ඇති බව. | අරමුණු ඉටුකර ගැනීමට කටයුතු මෙහෙයවිය යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රම වෙළඳපොලට වඩාත් ගැලපෙන යෝග්‍ය කුසලතාවලින් යුතු මානව සම්පතක් බිහිකිරීමේ වැය විෂය යටතේ ප්‍රවර්ධන වීඩියෝ වැඩසටහන් 13 ක් නිර්මාණයට හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා ප්‍රවර්ධන වීඩියෝපට 6 ක් නිර්මාණය සඳහා රු.859,935 ක් වැය කර තිබුණද එකී කාර්යයන් අවසන්ව නොතිබුණි. | වැය ශීර්ෂ 328-2-2-4-2509 යටතේ ප්‍රවර්ධන විඩියෝපට 06ක් (එනම් සිංහල මාධ්‍ය 03ක් සහ එය දෙමළ මාධ්‍ය පරිවර්ථන 03ක් ලෙස) සකස් කිරීමට කටයුතු කෙරිණි. මෙහිදී සිංහල විඩියෝපට 03 දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතර, එම සිංහල විඩියෝපටවල යම් යම් සංස්කරණ සිදුකළයුතු බව නිරීක්ෂණය විය. එම සංශෝධන මේ වන විට සිදුකරමින් පවතින බැවින් එය අවසන් වූ පසුව – දෙමළ භාෂා මාධ්‍ය විඩියෝපට සංස්කරණය කිරීමට නියමිත බව. | කාර්යභාරයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකිරීමේ අරමුණින්, අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට 2021 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ඇති කරගෙන තිබූ එකඟතාවය පරිදි පළමු අදියර සඳහා රු.2,060,615 ක් ගෙවීම් කර තිබුණි. මෙම පද්ධතිය මගින් වැඩසටහන් සැලසුම් කිරීම, කාර්මික වෙළඳපල තොරතුරු සකස් කිරීම, නිවාඩු ලේඛන සැකසීම, පුහුණු කටයුතු හා ස්ථානමාරු කළමනාකරණය යන අංශ සිදුකිරීමට නියමිතව තිබුණද, සේවකයන්ගේ පුද්ගලික ලිපිගොනු තොරතුරු පමණක් පද්ධතිය තුල පැවති අතර අනෙකුත් අපේක්ෂිත තොරතුරු මෙහෙයුම් පද්ධතිය හරහා සිදුවන බවට තහවුරු නොවීය. | මෙම තොරතුරු පද්ධතියේ පළමු අදියර තුළට, වැඩසටහන් සැලසුම් කිරීම, කාර්මික වෙළඳපල තොරතුරු සකස් කිරීම, නිවාඩු ලේඛන සැකසීම, පුහුණු කටයුතු හා ස්ථාන මාරු කළමණාකරණය යන අංශ අයත්ව තිබූ අතර වැය කළමණාකරණය සහ වාහන කළමනාකරණය මෙම පද්ධතියේ පළමු අදියරට ඇතුළත්ව නොතිබුණු බව. | අරමුදල් යෙදවීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට අවධානය යොමු කල යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් ජීප් රථයක් 2023 මැයි 11 දින අධිවේගී මාර්ගයේදී රේඩියේටරයේ උඩ බාර් කොටස පුපුරා යාම නිසා තලවතුගොඩ ප්‍රදේශයේ ගරාජයකට අලුත්වැඩියාව සඳහා යොමුකර තිබුණි. අදාල ගරාජය 2023 මැයි 25 දින අලුත්වැඩියාව සඳහා රු.1,551,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර අදාල මිල ගණන් හා අලුත්වැඩියාවන් එම ආයතනයෙන් කර ගැනීමට සුදුසු බවට යාන්ත්‍රික ඉංජිනේරු වරයාගේ නිර්දේශය ලබාදීමට මාස තුනක කාල පමාවකින් සිදුවී තිබුණි. රේඩියේටර් උඩ බාර් කොටස පුපුරා යාම නිසා සිදු වූ හානියක් වාර්තා වී තිබූ අතර, එම හානිය මගින් වාර්තා වී නොතිබූ කාර්යන් සඳහා එකී සියලු අමතර කොටස් යොදා ඇලුත්වැඩියාව සිදු කිරීම කර තිබුණි. | ජීප් රථය අධිවේගී මාර්ගයේදී 2023.05.11 දිනැතිව ඇති වූ දෝෂ තතත්වය සම්බන්ධයෙන් රියදුරුගේ දැනුම්දීම මත (දුරකථනය ඔස්සේ) කැරියර් සහිත මිළ ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස ප්‍රවාහන වැඩ මූලික විසින් ලබා දුන් නිර්දේශය මත මෝටර්ස් ආයතනයක් වෙත අදාළ වාහනය යොමු කර ඇත. රථය අළුත්වැඩියාව සම්බන්ධයෙන් එවකට සිටි ප්‍රවාහන වැඩ මූලික හා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ ඇතුළත් ලිපි අමුණා ඇත. මෙම සිදුවීමෙන් පසු 2023 මැයි මස මෙම දෙපාර්මේන්තුව වෙත ස්ථානමාරුවී පැමිණි නව අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ මිල ඇස්තමේන්තුව ඉහළ වටිනාකමකින් යුක්තවීම හේතුවෙන් මෙම රථයේ අළුත්වැඩියාව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදු කිරීමට තීරණය කර ඇත. නව අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් දෙපාර්මේන්තු වාහන නඩත්තු කටයුතු සඳහා නව යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු පත් කර ඇත. ඉහත කී යොමුගත මිල ඇස්තමේන්තුව සඳහා නැවතත් නව යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය 2023.08.22 දිනැතිව ලබා ගැනීමෙන් පසු එම මිල ඇස්තමෙන්තුව ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර අදාළ අළුත්වැඩියාව සිදු කර ඇති බව. | රථවාහන අලුත්වැඩියාවන් නිසි පරීක්ෂාවකින් හා අධීක්ෂණයකින් සිදුකල යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවා අංශය විසින් පවත්වන රැකියා පොළ, වෘත්තීය පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ සම්බන්ධ වීඩියෝ පට සැකසීම, වෙබ් අඩවියේ | මහජන රැකියා සේවා අංශයේ ඉල්ලීම පරිදි මෙම කැමරාව මිළදී ගැනීමට කටයුතු කළ අතර 328-1-1-0-2102 ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරන වැය විෂයෙන් කැමරාවද, එහි උපාංග328-1-1-0-2002 යන්ත්‍ර හා | වත්කම් අවශ්‍යතාවය මත ප්‍රසම්පාදනය කලයුතු අතර උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කල යුතුය. |

| | | |
|---|---|---|
| පළකිරීම, ෆේස්බුක් පිටුවේ පලකිරීම සඳහා රු.548,435 ක් වැයකර කැමරාවක් හා උපාංග මිලදී ගෙන තිබුණි. 2022 වර්ෂයේදී මෙකී අවශ්‍යතා සඳහා රු.5,228,193 ක් වැයකර කැමරා 30 මිලදී ගෙන තිබූ නමුත් වීඩියෝ නිර්මාණ සැකසීම සඳහා 2023 වර්ෂයේදීද බාහිර ආයතන වෙත රු.859,935 ක් ගෙවා තිබුණි. | උපකරණ (improvement) වැය විෂයෙහි ප්‍රතිපාදන භාවිතා කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට මිලදී ගන්නා ලදී.<br>2022 හි මිලදී ගත් කැමරා ඉහත දැක්වූ පහසුකම් වලින් යුක්ත නොවන අතර, (වීඩියෝ සඳහා විශේෂිත වූ) ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍රයේ වැඩ කරන නිලධාරීන් වෙනුවෙන් ලබා ගන්නා ලද කැමරා වන අතර එම කැමරා දිස්ත්‍රික් සඳහා ලබාදී ඇති බැවින් ඉහත දක්වන ලද විශේෂ අවශ්‍යතාවය මත නව කැමරාවක් ලබාගන්නා ලද බව. | |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා නාගරික සංවර්ධන හා ආයෝජන පුද්ගලික සමාගමට මාසිකව රු.3,548,342 ක කල්බදු වාරිකයක් බැගින් වාර්ෂිකව රු.42,580,104 ක පිරිවැයක් ගෙවීමට සිදුව ඇති අතර, අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීම හා පරිපාලන පහසුව සඳහා මෙහෙවර පියෙස හෝ කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ භාවිතා නොකරන පරිශ්‍රයක ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සෙත්සිරිපාය දෙවන මහළ පරිශ්‍රයේ පවත්වාගෙන යාම හේතුවෙන් දරනු ලබන වැය බර අවම කර ගැනීම සඳහා මහලේකම් කාර්යාල පරිශ්‍රයට හෝ මෙහෙවර පියස ගොඩනැගිල්ල අළුත්වැඩියා කර රැගෙන යාම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් යෝජනා කර ඇති නමුත් ඒ සම්බන්ධයෙන් විධිමත් දැනුවත් කිරීමක් සිදුව නොමැති බැවින් ද, එතෙක් මෙම දෙපාර්තමේන්තුව පවත්වාගෙන යාම සඳහා පරිශ්‍රයක් අවශ්‍ය බැවින් ඒ සම්බන්ධ විධිමත් තීරණයක් ගන්නා තෙක් දෙපාර්තමේන්තුව දුරටත් මෙම පරිශ්‍රයේ පවත්වා ගෙන යාම සිදුවන බව. | වඩාත් කාර්යක්ෂම ලෙස දෙපාර්තමේන්තුව පවත්වා ගැනීමේ වැයබර දැරිය යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය (i) (ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු සහ ගණන්දීමේ නිලධාරියකුගේ වගකීම යටතේ අභ්‍යන්තර විගණන කාර්යය හා කර්තව්‍ය | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන තනතුර සඳහා පුරප්පාඩු ඇති බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දිගින් දිගටම දැනුම් දී ඇති අතර, ගණකාධිකාරි සේවයේ පුරප්පාඩු 500 කට ආසන්න ප්‍රමාණයක් ඇති බැවින් මෙම ඉල්ලීම | සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගත යුතුය. |

නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර වසර කිහිපයක් තිස්සේ පුරප්පාඩුව පැවතීමෙන් එම කර්තව්‍ය නිසි පරිදි ඉටුවී නොතිබුණි.

පිලිබඳව ප්‍රමුඛතාවය ලැබී නොමැත. එබැවින් එම තනතුරේ වැඩබැලීමට හෝ රාජකාරි ආවරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස පරිශ්‍රයේ ගණකාධිකාරි සේවයේ නිලධාරින් ගෙන් ඉල්ලීම් ද සිදුකර ඇත. 2023-09-27 දිනැතිව අමාත්‍යාංශ ලේකම්තුමාට ලිපියක් යොමු කර ඇති බව.